# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2292/13 - 2022 අගෝස්තු මස 09 වැනි අඟහරුවාදා - 2022.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### තැපැල් කාර්යාල ආඥාපනත

(190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 7, 8 යන වගන්ති යටතේ තැපැල් විෂය භාර අමාත්‍යවරයා ලෙස, ජනමාධ්‍ය අමාත්‍යවරයා වන මවිසින් මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව සම්පාදනය කරන ලද ව්‍යවස්ථාව.

ආචාර්ය බන්දුල ගුණවර්ධන (පා. ම.),
ජනමාධ්‍ය අමාත්‍ය.

2022 අගෝස්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

ව්‍යවස්ථා

1934 නොවැම්බර් මස 30 වැනි දින අංක 8093 දරන *ගැසට් පත්‍රයේ* අතිරේකයෙහි පළකරනු ලැබූ සහ තදන්තර යම් ව්‍යවස්ථාවකින් සංශෝධිත 1934 මෙරට තැපැල් ව්‍යවස්ථාව, 2018.06.07 දින අංක 2274/32 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයෙන් සංශෝධනය කරන ලදුව තවදුරටත් 2022 අගෝස්තු මස 15 දින සිට පහත සඳහන් පරිදි වන ව්‍යවස්ථා පමණක් මෙමගින් සංශෝධනය කරනු ලැබේ.

1- 9 වන ව්‍යවස්ථාවේ (2) ඡේදයේ රුපියල් 18.00 යන ඉලක්කම වෙනුවට රු. 60.00 ඉලක්කම ආදේශ කිරීමෙන් ද, රුපියල් 20.00 යන ඉලක්කම වෙනුවට රු. 70.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

2- 12 වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ රුපියල් 15.00 යන ඉලක්කම වෙනුවට රුපියල් 50.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද එතැන් සිට
ග්‍රෑම් 100 දක්වා වැඩිවන ග්‍රෑම් 20ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින් ද,
ග්‍රෑම් 100 සිට ග්‍රෑම් 250 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 50ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද,
ග්‍රෑම් 250 සිට ග්‍රෑම් 1000 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 50ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 30.00 බැගින් ද,

1A - PG 5918— 516 (2022/08)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ග්‍රෑම් 1000 සිට ග්‍රෑම් 2000 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 250ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 බැගින් ද යන වගන්ති වෙනුවට
ග්‍රෑම් 20ට වැඩි ග්‍රෑම් 100 දක්වා වැඩිවන ග්‍රෑම් 10ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10/- බැගින් ද,
ග්‍රෑම් 100ට වැඩි ග්‍රෑම් 1000 තෙක් වැඩිවන ග්‍රෑම් 50ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 20/- බැගින් ද,
ග්‍රෑම් 1000 ට වැඩි ග්‍රෑම් 2000 තෙක් වැඩිවන ග්‍රෑම් 250ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 30/- බැගින් ද යන වගන්ති ඇතුළත් කිරීමෙන් ද,
12 වන ව්‍යවස්ථාවේ 3 වන ඡේදයේ රුපියල් 12.00 යන ඉලක්කම වෙනුවට රුපියල් 30.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

3- 19 වන ව්‍යවස්ථාවේ රුපියල් 10.00 යන ඉලක්කම වෙනුවට රු. 20.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

4- 21 වන ව්‍යවස්ථාවේ මුද්‍රිත ද්‍රව්‍ය විවෘත සාමාන්‍ය ලිපි සඳහා මුල් ග්‍රෑම් 20ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 12.00 ක් ද
ග්‍රෑම් 40 දක්වා වැඩිවන ග්‍රෑම් 20ක් හෝ කොටසක් සඳහා රු. 8.00 ක් ද,
ග්‍රෑම් 40 සිට ග්‍රෑම් 100 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 20ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද,
ග්‍රෑම් 100 සිට ග්‍රෑම් 250 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 30ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද,
ග්‍රෑම් 250 සිට ග්‍රෑම් 500 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 50ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද,
ග්‍රෑම් 500 සිට ග්‍රෑම් 1000 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 100ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද,
ග්‍රෑම් 1000 සිට වැඩිවන සෑම ග්‍රෑම් 500ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද
යන වගන්ති වෙනුවට
පළමු ග්‍රෑම් 30 හෝ ඉන් කොටසක් සඳහා රු. 30.00 ක් ද
ග්‍රෑම් 30ට වැඩි ග්‍රෑම් 900 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 30 හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද,
ග්‍රෑම් 900ට වැඩි ග්‍රෑම් 960 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 30ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 25.00 බැගින් ද,
ග්‍රෑම් 960ට වැඩි ග්‍රෑම් 1000 තෙක් වැඩිවන ග්‍රෑම් 40ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 25.00 බැගින් ද,
ග්‍රෑම් 1000ට වැඩි ග්‍රෑම් 2000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 500ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 බැගින් ද, යන වගන්ති ආදේශ කිරීමෙන් ද,

5- 25 වන ව්‍යවස්ථාවේ (1) ඡේදයේ
පළමු ග්‍රෑම් 60 සඳහා රු. 10.00 ක් ද,
ග්‍රෑම් 60 වැඩි ග්‍රෑම් 120 දක්වා රු. 15.00 ක් ද,
ග්‍රෑම් 120 වැඩි ග්‍රෑම් 240 දක්වා රු. 25.00 ක් ද,
ග්‍රෑම් 240 වැඩි ග්‍රෑම් 360 දක්වා රු. 40.00 ක් ද,
ග්‍රෑම් 360 වැඩි ග්‍රෑම් 480 දක්වා රු. 50.00 ක් ද,
ග්‍රෑම් 480 වැඩි ග්‍රෑම් 600 දක්වා රු. 60.00 ක් ද,
ග්‍රෑම් 600 වැඩි ග්‍රෑම් 720 දක්වා රු. 75.00 ක් ද,
ග්‍රෑම් 720 වැඩි ග්‍රෑම් 840 දක්වා රු. 85.00 ක් ද,
ග්‍රෑම් 840 වැඩි ග්‍රෑම් 960 දක්වා රු. 90.00 ක් ද,
ග්‍රෑම් 960 වැඩි ග්‍රෑම් 1,000 දක්වා රු. 100.00 ක් ද, යන්න වෙනුවට
පළමු ග්‍රෑම් 60 හෝ ඉන් කොටසක් සඳහා රු. 20.00 බැගින් ද,
ග්‍රෑම් 60 සිට ග්‍රෑම් 120 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 60ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින් ද,
ග්‍රෑම් 120 සිට ග්‍රෑම් 960 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 120ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින් ද,
ග්‍රෑම් 960 සිට ග්‍රෑම් 1000 දක්වා වැඩිවන ග්‍රෑම් 40ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින් ද යන වගන්ති ඇතුළත් කිරීමෙන් ද,

6- 30 වන ව්‍යවස්ථාවේ පළමු ග්‍රෑම් 250 යන වචන වෙනුවට පළමු ග්‍රෑම් 250 හෝ ඉන් කොටසක් සඳහා යන වචන හා රුපියල් 90.00ක් යන ඉලක්කම වෙනුවට රුපියල් 150.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද එතැන් සිට,

ඊළඟ ග්‍රෑම් 250ක් හෝ ඉන් කොටසක් සඳහා රුපියල් 20.00 බැගින් ද,
ග්‍රෑම් 500 සිට ග්‍රෑම් 1500 දක්වා වැඩිවන ග්‍රෑම් 500ක් හෝ ඉන් කොටසක් සඳහා රුපියල් 20.00 බැගින් ද,
ග්‍රෑම් 1500 සිට ග්‍රෑම් 3000 දක්වා වැඩිවන ග්‍රෑම් 500 හෝ ඉන් කොටසක් සඳහා රුපියල් 50.00 බැගින් ද,
ග්‍රෑම් 3000 සිට ගෑම් 4000 දක්වා වැඩිවන ග්‍රෑම් 1000 හෝ ඉන් කොටසක් සඳහා රුපියල් 50.00 බැගින් ද,
ග්‍රෑම් 4000 සිට ග්‍රෑම් 20000 දක්වා වැඩිවන ග්‍රෑම් 1000 හෝ ඉන් කොටසක් සඳහා රුපියල් 50.00 බැගින් ද යන්න වෙනුවට,
250g ට වැඩි 500g දක්වා වැඩිවන 250g හෝ ඉන් කොටසකට රු. 50.00 බැගින් ද,
ග්‍රෑම් 500ට වැඩි ග්‍රෑම් 1000 තෙක් වැඩිවන ග්‍රෑම් 500 හෝ ඉන් කොටසක් සඳහා රුපියල් 50.00 බැගින් ද,
ග්‍රෑම් 1000ට වැඩි ග්‍රෑම් 10000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 1000ක් හෝ ඉන් කොටසක් සඳහා රුපියල් 50.00 බැගින් ද,

ග්‍රෑම් 10000ට වැඩි ග්‍රෑම් 20000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 5000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 100.00 බැගින් ද යන්න ආදේශ කිරීමෙන් ද,

7- 40 වන ව්‍යවස්ථාවේ (1) (c) ඡේදයේ රු. 50.00 ඉලක්කම වෙනුවට රු. 100.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

8- 43 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදයේ රුපියල් දහය යන වචන වෙනුවට රු. 25.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

9- 44 වන ව්‍යවස්ථාවේ (1) b ඡේදයේ රු. 25.00 ඉලක්කම වෙනුවට රු. 100.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

10- 45 වන ව්‍යවස්ථාවේ (1) ඡේදයේ රු. 35.00 ඉලක්කම වෙනුවට රු. 150.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

11- 46 වන ව්‍යවස්ථාවේ ඇතුළත් කරුණු ඉවත් කර "මෙම සේවාව අවලංගු කෙරේ" යන වචන ආදේශ කිරීමෙන් ද,

12- 59 වන ව්‍යවස්ථාවේ (3) ඡේදයේ රු. 5,000.00 ඉලක්කම වෙනුවට රු. 10,000.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

13- 62 වන ව්‍යවස්ථාවේ රු. 30/- යන ඉලක්කම වෙනුවට රු. 60/- යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

14- 64 වන ව්‍යවස්ථාවේ (2) ඡේදයේ රු. 100.00 ඉලක්කම වෙනුවට රු. 200.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

15- 67 වන ව්‍යවස්ථාවේ (1) ඡේදයේ රු. 30.00 ඉලක්කම වෙනුවට රු. 100.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

16- 72 වන ව්‍යවස්ථාවේ රු. 25.00 ඉලක්කම වෙනුවට රු. 100.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

17- 80 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදය සම්බන්ධයෙන් මෙතෙක් සිදුකළ සංශෝධන අහෝසි කරමින් ඒ වෙනුවට වටිනාකම ගෙවා භාරගන්නා පාර්සල් සේවාව යටතේ යවන්නා විසින් පාර්සලයේ වටිනාකම ලෙස නියම කරන ලද මුදල රු. 50.00ට නොඅඩු සහ රු. 10,000.00ට නොවැඩි විය යුතුවේ. යන්න ආදේශ කිරීමෙන් ද,

18- 81වන ව්‍යවස්ථාවේ (4) වන ඡේදය සම්බන්ධයෙන් මෙතෙක් සිදුකළ සියළු සංශෝධන අහෝසි කරමින් ඒ වෙනුවට වටිනාකම ගෙවා භාරගන්නා පාර්සල් සේවාව මගින් යැවිය හැකි උපරිම බර කිලෝග්‍රෑම් 20ක් ද ඒ සඳහා අය කරන තැපැල් ගාස්තුව වශයෙන්,

පළමු 250g සඳහා රු. 150.00ක් ද,
250g ට වැඩි 500g දක්වා වැඩි වන 250g හෝ ඉන් කොටසකට රු. 50.00 බැගින් ද,
500g ට වැඩි 1,000g දක්වා වැඩිවන 500g හෝ ඉන් කොටසකට රු. 50.00ක් ද,
1,000gට වැඩි සහ 10,000g දක්වා වැඩිවන සෑම 1,000g හෝ ඉන් කොටසකට සඳහා රු. 50.00ක් ද,
10,000g ට වැඩි සහ 20,000g තෙක් වැඩිවන සෑම 5,000g හෝ ඉන් කොටසක් සඳහා රු. 100.00ක්ද යන්න සහ එක් එක් භාණ්ඩය තැපැල් කිරීමේ හා භාරදීමේ ගාස්තුව රු. 50.00ක්ද යන්න ආදේශ කිරීමෙන් ද,

19- 93 වන ව්‍යවස්ථාවේ සඳහන් ව්‍යාපාරික තැපෑල සඳහා ග්‍රෑම් 30ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 15.00 යන වගන්තිය වෙනවුට 93 වන ව්‍යවස්ථාවේ 1 ඡේදය යටතේ,
පළමු ග්‍රෑම 20 හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 ක් ද,
ග්‍රෑම් 20ට වැඩි ග්‍රෑම් 100 දක්වා වැඩිවන ග්‍රෑම් 10ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10/- බැගින් ද,
ග්‍රෑම් 100ට වැඩි ග්‍රෑම් 1,000 තෙක් වැඩිවන ග්‍රෑම් 50ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 20/- බැගින් ද,
ග්‍රෑම් 1,000ට වැඩි ග්‍රෑම් 2,000 තෙක් වැඩිවන ග්‍රෑම් 250ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 30/- බැගින් ද යන වගන්ති ඇතුළත් කිරීමෙන් ද,

93 වන ව්‍යවස්ථාවේ සඳහන් කොළඹ නාගරික බෙදීම් කලාප 15 ඇතුළත බෙදීම සඳහා මධ්‍ය තැපැල් හුවමාරුවෙන් භාරගන්නා ලිපි (අවමය 25,000) සඳහා බර ග්‍රෑම් 20දක්වා වන ලිපියකට රුපියල් 12.00ක් ද යන වගන්තිය වෙනුවට 93 වන ව්‍යවස්ථාවේ 2 ඡේදය යටතේ කොළඹ නාගරික බෙදීම් කලාප 15 ඇතුළත බෙදීමට මධ්‍ය තැපැල් හුවමාරුවෙන් භාරගන්නා ලිපි යටතේ උපරිම බර ග්‍රෑම් 20ක් වන ලිපියක් සඳහා රු. 30.00ක්ද වරකට භාරගන්නා අවම ලිපි සංඛ්‍යාව 10,000ක්ද වේ යන වගන්තිය ආදේශ කිරීමෙන් ද,

20- 94 වන ව්‍යවස්ථාවේ මුද්‍රිත ද්‍රව්‍ය විවෘත ව්‍යාපාරික ලිපි සඳහා

මුල් ග්‍රෑම් 20ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 12.00 ක් ද,
ග්‍රෑම් 40 දක්වා වැඩිවන ග්‍රෑම් 20ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 8.00 ක් ද,
ග්‍රෑම් 40 සිට ග්‍රෑම් 100 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 20ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද,
ග්‍රෑම් 100 සිට ග්‍රෑම් 250 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 30ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද,
ග්‍රෑම් 250 සිට ග්‍රෑම් 500 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 50ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද,
ග්‍රෑම් 500 සිට ග්‍රෑම් 1,000 දක්වා වැඩිවන සෑම ග්‍රෑම් 100ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද,
ග්‍රෑම් 1,000 සිට වැඩිවන සෑම ග්‍රෑම් 500ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද, යන වගන්ති වෙනුවට
පළමු ග්‍රෑම් 30 හෝ ඉන් කොටසක් සඳහා රු. 30.00 ක් ද,
ග්‍රෑම් 30ට වැඩි ග්‍රෑම් 900 තෙක් වැඩිවන ග්‍රෑම් 30 හෝ ඉන් කොටසක් සඳහා රු. 5.00 බැගින් ද,
ග්‍රෑම් 900ට වැඩි ග්‍රෑම් 960 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 30ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 25.00 බැගින් ද,
ග්‍රෑම් 960ට වැඩි ග්‍රෑම් 1,000 තෙක් වැඩිවන ග්‍රෑම් 40ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 25.00 බැගින් ද,
ග්‍රෑම් 1,000ට වැඩි ග්‍රෑම් 2,000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 500ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 බැගින් ද, යන වගන්ති ආදේශ කිරීමෙන් ද,

21- 95වන ව්‍යවස්ථාවේ (i) වන ඡේදයේ ඇතුළත් කරුණු ඉවත් කර "මෙම සේවාව අවලංගු කෙරේ" යන වචන ආදේශ කිරීමෙන් ද, ඒ වෙනුවට Logi Post හා Speed Post සේවාවන් දෙක ඒකාබද්ධ කරමින් SL POST COURIER නව සේවාව හඳුන්වාදීමෙන් ද,

(a) යැවිය හැකි උපරිම බර කිලෝග්‍රෑම් 40 ක්ද,

(b) ඒ සඳහා අය කරන තැපැල් ගාස්තුව වශයෙන් ;
පළමු 250g හෝ ඉන් කොටසක් සඳහා රු. 200.00ක් ද,
250gට වැඩි 500g දක්වා වැඩිවන 250g හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 ක්ද,
500gට වැඩි 1,000g දක්වා වැඩිවන 500g හෝ ඉන් කොටසක් සඳහා රු. 100.00 ක්ද,
1,000gට වැඩි 10,000g දක්වා වැඩිවන සෑම 1,000g හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 ක්ද,
10,000gට වැඩි 15,000g දක්වා වැඩිවන 5,000g හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 ක්ද,
15,000gට වැඩි 20,000g දක්වා වැඩිවන 5,000g හෝ ඉන් කොටසක් සඳහා රු. 250.00 ක්ද,
20,000gට වැඩි 40,000g දක්වා වැඩිවන 5,000g හෝ ඉන් කොටසක් සඳහා රු. 500.00 ක්ද,

(c) මෙම සේවාව යටතේ අමාත්‍යාංශ හා රාජ්‍ය දෙපාර්තමේන්තු විසින් යොමු කරනු ලබන උපරිමය ග්‍රෑම් 30ක් දක්වා වූ ලිපියක් සඳහා අය කරනු ලබන තැපැල් ගාස්තුව රු. 150.00 ක් ද, යන්න ඇතුළත් කිරීමෙන් ද,

22- 95වන ව්‍යවස්ථාවේ (II) වන ඡේදය a, b වශයෙන් ඡේද දෙකකට වෙන් කිරීමෙන්
දැනට පවතින ඡේදයේ **a කොටස** යටතේ උපරිම බර ග්‍රෑම් 20ක් වන පළමු පත්‍රිකා 1,000 සඳහා රු. 6,000.00 ක් ද,
වැඩිවන පත්‍රිකා 1,000 ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 5,000.00 බැගින් ද,
බර ග්‍රෑම් 20ට වඩා වැඩි සහ ග්‍රෑම් 40 හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1,000 සඳහා රු. 7,000.00 ක් ද,
වැඩිවන පත්‍රිකා 1,000ක් හෝ කොටසක් සඳහා රු. 6,000.00 බැගින් ද,
බර ග්‍රෑම් 40ට වඩා වැඩි සහ ග්‍රෑම් 60 හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1,000ක් සඳහා රු. 8,000.00 ක් ද,
වැඩිවන පත්‍රිකා 1,000ක් හෝ කොටසක් සඳහා රු. 7,000.00 බැගින් ද,
ග්‍රෑම් 60ට වඩා වැඩි සහ ග්‍රෑම් 80 හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1,000ක් සඳහා රු. 9,000.00ක් ද,
වැඩිවන පත්‍රිකා 1,000ක් හෝ කොටසක් සඳහා රු. 8,000.00 බැගින් ද,
ග්‍රෑම් 80ට වැඩිවන සහ ග්‍රෑම් 100 හෝ ඊට අඩු පළමු පත්‍රිකා 1,000 සඳහා රු. 10,000 ක් ද
වැඩිවන පත්‍රිකා 1,000ක් හෝ කොටසක් සඳහා රු. 9,000.00 ලෙස ද,

**b කොටස** යටතේ ප්‍රචාරණ තැපැල් සේවාව සඳහා අගය එකතු කර සාම්පල බෙදා හැරීමේ නව සේවාව වගන්ති ඇතුළත් කිරීමෙන්ද (වෙළඳ සාම්පලයේ උපරිම බර 100g ලෙස)

සාම්පල භාරගනු ලබන කාර්යාලයෙන්ම බෙදා හැරීම සිදුකරන්නේ නම්, තැපැල් ගාස්තු වශයෙන්, පළමු සාම්පල 1,000හෝ ඉන් කොටසකට රු. 20,000.00 බැගින් ද, වැඩිවන සාම්පල 1,000ක් හෝ ඉන් කොටසකට රු. 15,000.00ක් ද,

සාම්පල භාරගැනීම මාර්ගස්ථ කාර්යාලයකින් සිදුකරන්නේ නම් තැපැල් ගාස්තු වශයෙන්, පළමු සාම්පල 1,000ක් හෝ ඉන් කොටසකට රු. 30,000.00ක් ද, වැඩිවන සාම්පල 1,000ක් හෝ ඉන් කොටසකට රු. 25,000.00 ක් ද යන වගන්ති ඇතුළත් කිරීමෙන් ද,

23- 95 වන ව්‍යවස්ථාවේ (iii) වන ඡේදයේ ඇතුළත් කරුණු ඉවත් කර "මෙම සේවාව අවලංගු කෙරේ" යන වචන ආදේශ කිරීමන් ද,

24- 95 වන ව්‍යවස්ථාවේ (iv) වන ඡේදයේ ඇතුළත් කරුණු ඉවත් කර "මෙම සේවාව අවලංගු කෙරේ" යන වචන ආදේශ කිරීමෙන් ද ඒ වෙනුවට "ලබන්නා වෙතින් වටිනාකම අය කර භාණ්ඩ බෙදීමේ සේවාව (CoD) ;

a. යැවිය හැකි උපරිම බර කිලෝග්‍රෑම් 40 ක්ද;

b. ඒ සඳහා අය කරන තැපැල් ගාස්තුව වශයෙන් ද;
පළමු 250g හෝ ඉන් කොටසක් සඳහා රු. 200.00 ක් ද,
250gට වැඩි 500g දක්වා වැඩිවන 250g හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 ක් ද,
500gට වැඩි 1,000g දක්වා වැඩිවන 500g හෝ ඉන් කොටසක් සඳහා රු. 100.00 ක් ද,
1,000gට වැඩි 10,000g දක්වා වැඩිවන 1,000g හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 ක් ද,
10,000gට වැඩි 15,000g දක්වා වැඩිවන 5,000g හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 ක් ද,
15,000gට වැඩි 20,000g දක්වා වැඩිවන 5,000g හෝ ඉන් කොටසක් සඳහා රු. 250.00 ක් ද,
20,000gට වැඩි 40,000g දක්වා වැඩිවන 5,000g හෝ ඉන් කොටසක් සඳහා රු. 500.00 ක් ද යන්න හා

c. ලබන්නා වෙතින් වටිනාකම අය කර භාණ්ඩ බෙදීමේ සේවාව සඳහා රු. 50.00ක ස්ථාවර ගාස්තුවක් එකතු කිරීමන් ද, ඊට අමතරව වටිනාකම ගෙවා භාරගන්නා පාර්සල පරිදි යවනු ලබන භාණ්ඩයේ වටිනාකමට අදාළ මුදලට සමාන මුදල් ඇණවුම් ගාස්තුවක් අය කිරීම" යන වචන ඇතුළත් කිරීමෙන් ද,

25- 95 වන ව්‍යවස්ථාවේ (VIII) ඡේදයේ රු. 100.00 ඉලක්කම වෙනුවට රු. 200.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

26- 95 වන ව්‍යවස්ථාව සඳහා අලුතින් (xi) ලෙස ඡේදයක් ඇතුළත් කිරීමෙන්ද එනම් අමාත්‍යාංශ හා රාජ්‍ය දෙපාර්තමේන්තු සඳහා ලබා දෙන නව විශේෂ ලියාපදිංචි තැපැල් පහසුකම යටතේ යැවිය හැකි උපරිම බර කිලෝග්‍රෑම් 05ක්ද ඒ සඳහා අය කරන තැපැල් ගාස්තුව වශයෙන් ලියාපදිංචි ලිපි තැපැල් ගාස්තුව වන රු. 60.00 ට අමතරව

පළමු ග්‍රෑම් 20 සඳහා රු. 50.00 ක් ද,
ග්‍රෑම් 20ට වැඩි ග්‍රෑම් 100 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 10ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින් ද,
ග්‍රෑම් 100ට වැඩි ග්‍රෑම් 1,000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 50 හෝ ඉන් කොටසක් සඳහා රු. 20.00 බැගින් ද,
ග්‍රෑම් 1,000ට වැඩි ග්‍රෑම් 2,000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 250ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 30.00 බැගින් ද,
ග්‍රෑම් 2,000ට වැඩි ග්‍රෑම් 5,000 තෙක් වැඩිවන සෑම ග්‍රෑම් 1,000ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 බැගින් ද, අය කෙරේ යන වගන්තිය ඇතුළත් කිරීමෙන් ද,

27- 96 වන ව්‍යවස්ථාවේ ටෙලිමේල් ගාස්තු ලෙස

පළමු වචන 10 සඳහා රු. 30.00 ඉලක්කම වෙනුවට රු. 50.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,
වැඩිවන වචනයක් සඳහා රු. 2.00 ඉලක්කම වෙනුවට රු. 5.00යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,
ස්ථාවර ගාස්තුව රු. 10.00 ඉලක්කම වෙනුවට රු. 20.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,
පණිවුඩය බෙදීමේ සහතිකය රු. 20.00 ඉලක්කම වෙනුවට රු. 30.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,
යවන ලද මුල් පණිවුඩයේ සහතික කළ පිටපතක් සඳහා රු. 50.00 ඉලක්කම වෙනුවට රු. 100.00 යන ඉලක්කම ආදේශ කිරීමෙන් ද,

28- 97 වන ව්‍යවස්ථාවේ
පළමු කිලෝ ග්‍රෑම් 10 සඳහා රු. 200.00 ක් ද,
ඊට වැඩිවන සෑම කිලෝග්‍රෑම් 1ක් සඳහා උපරිම කිලෝ 20 දක්වා රු. 20.00 බැගින් ද යන්න වෙනුවට,
පළමු කිලෝ ග්‍රෑම් 10 සඳහා රු. 300.00 ක් ද,
ඊට වැඩිවන සෑම කිලෝග්‍රෑම් 1ක් සඳහා උපරිම කිලෝ 20 දක්වා රු. 50.00 බැගින් යන්න ආදේශ කිරීමෙන් ද

29- ව්‍යවස්ථාව සඳහා 98 ඡේදයේ අළුතෙන් ඇතුළත් කිරීමෙන්,
1982.01.15 දින අංක 759 දරන තැපැල් කාර්යාල චක්‍රලේඛයේ විෂයාංක 1 (ඒ) යටතේ පළ කරන ලද දැන්වීමේ 3:7 අනුඡේදය හා 1986 අප්‍රේල් 11 වැනි දින අංක 980 දරන ශ්‍රී ලංකා තැපැල් කාර්යාල චක්‍රලේඛයේ පොදු 172 කුවිතාන්සියේ අනු පිටපතක් ඉල්ලුම්කරු විසින් ඉල්ලා සිටින අවස්ථාවක ඒ සඳහා නිකුත් කරනු ලබන අනු පිටපත සඳහා අය කරනු ලැබූ රු. 5.00 ගාස්තුව වෙනුවට රු. 100.00 යන්න අළුතින් ඇතුළත් කිරීමෙන් ද,

30- මුදල් ඇණවුම් රීතිය
1985.11.13 දින අංක 375/4 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද මුදල් ඇණවුම් වලට අදාළ රීතිය 2022 අගෝස්තු මස 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

මුදල් ඇණවුම් කොමිස් හැරුණු විට සෑම විදුලි මුදල් ඇණවුමක් සඳහා ස්ථාවර ගාස්තුව රු. 10.00 යන්න වෙනුවට රු. 50.00 යන්න ආදේශ කිරීමෙන් ද,
4 (ii) දරන රීතියෙහි දැක්වෙන චක්‍රය වෙනුවට පහත චක්‍ර ආදේශ කිරීමෙන් ද,

**විද්‍යුත් මුදල් ඇණවුම් (PMT)**

පළමු රු. 2,000.00 දක්වා සෑම රු. 100.00ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 2.00 ක් ද,
රු. 2,001.00 සිට රු. 10,000.00 දක්වා වැඩිවන සෑම රු. 2,000.00ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 10.00 බැගින් ද,
රු. 10,001.00 සිට රු. 50,000.00 දක්වා වැඩිවන සෑම රු. 40,000.00ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 50.00 බැගින් ද,
රු. 50,001.00 සිට රු. 100,000.00 දක්වා වැඩිවන සෑම රු. 50,000.00ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 100.00 බැගින් ද අය කෙරේ යන වගන්තිය ඇතුළත් කිරීමෙන් ද,

**සාමාන්‍ය මුදල් ඇණවුම් (කඩදාසි භාවිතයෙන් නිකුත් කරන)**

පළමු රු. 2,000.00 දක්වා සෑම රු.100.00ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 3.00 ක් ද,
රු. 2,001.00 සිට රු. 10,000.00 දක්වා වැඩිවන සෑම රු. 2,000.00ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 15.00 බැගින් ද,
රු. 10,001.00 සිට රු. 50,000.00 දක්වා වැඩිවන සෑම රු. 40,000.00ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 75.00 බැගින් ද,

රු. 50,001.00 සිට රු. 100,000.00 දක්වා වැඩිවන සෑම රු. 50,000.00ක් හෝ ඉන් කොටසක් සඳහා රු. 150.00 බැගින් ද අය කෙරේ යන වගන්තිය ඇතුළත් කිරීමෙන් ද,

ෆැක්ස් මුදල් ඇණවුම් ස්ථාවර ගාස්තුව රු. 10.00ක් ද ෆැක්ස් මුදල් ඇණවුම් යැවීම සඳහා ගාස්තුව රු.30.00 ක් ද ෆැක්ස් මුදල් ඇණවුම සමග යවන පෞද්ගලික පණිවුඩයක මුල් වචන 10 හැර වැඩිවන වචනයක් සඳහ රු. 1.00ක් ද යන වගන්ති ඉවත් කර ඒ වෙනුවට "**ෆැක්ස් මුදල් ඇණවුම් සේවාව අවලංගු කෙරේ**" යන වගන්තිය ආදේශ කිරීමෙන් ද,

EOG 08-0064

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.